# POLITICAL IDEOLOGIES
# (Part I)

# ලිබරල් වාදය

මෙය *liber* යන ලතින් වචනයෙන් නිර්මාණය වූවකි. එහි අර්ථය වෙන්නේ 'නිදහස' යන්න යි.

ලිබරල් දේශපාලන දර්ශනය තුළත් ආර්ථික න්‍යාය තුළත්, 'නිදහස' යන්න සංකල්පගත කෙරුණේ රාජ්‍යයේ/ආණ්ඩුවේ අනවශ්‍ය මැදිහත් වීමෙන්, ඇඟිලි ගැසීමෙන් නිදහස් වීම'' (Freedom from undue government interference) යන ලෙසනි.

17 වැනි සියවසේ දී යුරෝපයේ පැවති වැඩවසම් සමාජ-ආර්ථික, දේශපාලන ක්‍රමය සහ සර්ව බලධාරී රාජාණ්ඩු ක්‍රමය පසුබිමේ ඒවාට එරෙහි ව මතු වූ අදහස් මාලාවක් හැටියට ද ලිබරල් වාදය හඳුන්වා දිය හැකි ය.

Class Work.LK

17 සියවස වන විට රජුගේ හිතුවක්කාර පාලන තන්ත්‍රයට එරෙහි වූ අලුත් සමාජ පන්තිවල නැගී ඒමක් ද විය. ධනවාදයේ ආරම්භක අවධිය වූ මෙකල බිහි වූ අලුත් වාණිජ හා මධ්‍යම පන්තිය, රාජ්‍යයේ හිතුවක්කාර පාලන ක්‍රමය ද, හිතුමතේ වෙළෙඳාම පාලනය කිරීම හා අයබදු ගැනීම කළ ආර්ථික පාලනය ද නො ඉවසී ය.

මෙවැනි පසුබිමක ඔවුන්ට අවශ්‍ය 'නිදහස' වූයේ රාජාණ්ඩුවේ හිතුවක්කාර දේශපාලන සහ ආර්ථික මැදිහත් වීම්වලින් මිදීම යි. පසු ව එය ලිබරල් වාදයේ ඇති මුඛ්‍යත ම මූලධර්මයක් ව වර්ධනය වූයේ ය.

මේ අනුව ලිබරල්වාදී සංකල්පයේ මූලික අර්ථය වූයේ රාජ්‍යයේ/ ආණ්ඩුවේ මැදිහත් වීම්වලින් සහ ඒවා පනවන සීමා/පාලනවලින් ලබන නිදහස යි. (Freedom from government's interference and constraints imposed by the government) මෙම අදහසෙහි දාර්ශනික ඇඟවීමක් සහ දේශපාලනික ඇඟවීමක් ද ගැබ් ව තිබිණි.

ClassWork.LK

1. දාර්ශනික ඇඟවීම
    - නිෂේධනීය නිදහස (negative Freedom) ලෙස සම්භාව්‍ය ලිබරල් වාදය විසින් නිදහස යන්නට, අලුත් අර්ථයක් සපයන ලදි. මෙයින් අදහස් වන්නේ බාධා, සීමා, මැදිහත් වීම් නොමැති වීම නිසා පුද්ගලයන් අත් විඳින නිදහස යි. (Freedom from constraints, බාධා නොමැති වීමෙන් ලබන නිදහස)

තව දුරටත්,

- හිතුවක්කාර ලෙස ආණ්ඩුව විසින් අත් අඩංගුවට ගනු ලැබීමෙන් තොර වීමේ නිදහස (Freedom from arbitrary arrest)

- හිතුවක්කාර ලෙස ආණ්ඩුව පනවන අයබදුවලින් තොර වීමෙන් ලබන නිදහස (freedom from arbitrary taxatiom) යනාදි ලෙස සම්භාව්‍ය ලිබරල්වාදී දර්ශන වාදය නිදහස ''නිෂේධනීය නිදහස'' ලෙසින් සංකල්ප ගත කොට ඇත.

ClassWork.LK

# දේශපාලනික ඇඟවීම

මින් අදහස් කර ඇත්තේ රාජ්‍ය නිර්බාධවාදය යි.

පසු කාලයේ ආර්ථික මූලධර්මයක් ලෙස වර්ධනය වූ රාජ්‍ය නිර්බාධවාදය (laissez-faire) යන්නෙන් කියැවුණේ ආර්ථික, සමාජ, දේශපාලන ක්ෂේත්‍රවලට ආණ්ඩුවේ මැදිහත් වීම අවම විය යුතු ය යන අදහස යි.

නිදහස් ආර්ථිකය සහ නිදහස් වෙළෙඳපොළ රාජ්‍ය නිර්බාධවාදය සමඟ බැඳුණු ප්‍රධාන සංකල්ප දෙකකි.

ආණ්ඩුවේ මැදිහත් වීම හා පාලනය අවම කරමින් නිදහස් ව ක්‍රියා කරන වෙළෙඳපොළක් මත ගොඩ නැගූ නිදහස් ආර්ථිකයක් පිළිබඳ අදහස එහි හරය වේ.

පෞද්ගලික නිදහස යන්න, නිදහස් වෙළඳපල සහ නිදහස් ආර්ථිකය සඳහා අත්‍යවශ්‍ය පූර්ව කොන්දේසියක් ලෙස සම්භාව්‍ය ලිබරල්වාදය සැලකී ය.

ClassWork.LK

# ලිබරල් වාදය සහ පෞද්ගලික නිදහස

පෞද්ගලික නිදහස - සම්භාව්‍ය ලිබරල් වාදයේ න්‍යායාත්මක මූලධර්මයක් වන අතර වර්තමාන ලිබරල් දේශපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා චින්තනයේ මුල්ගලක් ද බඳු සංකල්පයකි.

ලිබරල් දර්ශනවාදයේත්, සමාජ, දේශපාලන, ආර්ථික දෘෂ්ටිවාදවල සහ න්‍යායවලත් මූලික ඉගැන්වීමක් වන 'පෞද්ගලික නිදහස' (Individual Freedom) යන ප්‍රවාදය ගොඩ නගා තිබෙන්නේ උපකල්පන කිහිපයක් මත ය.

2. සමාජය සමන්විත වන්නේ තනි තනි පුද්ගලයන්ගෙනි. එබැවින් සමාජය වනාහි තනි තනි පුද්ගලයන්ගෙන් සමන්විත වන සමාජ ඒකකය ය. (Society is a collection of individuals)

3. සමාජය සමන්විත වන එක් එක් තනි පුද්ගලයා (Individual) වනාහි නිදහස් (Free), තාර්කික ව සිතිය හැකි (rational) සහ ස්වායත්ත (autonomous) මනුෂ්‍යයෙකි.

ClassWork.LK

5. සමාජය සමන්විත වන නිදහස්, තර්ක බුද්ධිය හිමි, සහ ස්වායත්ත පුද්ගලයන්ට තම මනුෂ්‍ය ශක්‍යතා උපරිම ලෙස සාක්ෂාත් කර ගැනීමට හැකිවන්නේ බාහිර, එනම් ආණ්ඩුවේ මෙන් ම සමාජයේ ද සීමා බාධක සහ මැදිහත් වීම් අවම කරමින් සහතික කෙරෙන ''නිදහස්'' පරිසරයක් තුළය. එය 'නිදහස' රජකරන පරිසරයකි.

6. ආණ්ඩුවේ වගකීම වන්නේ පෞද්ගලික නිදහස සහතික කරන චර්යාවකින් ආණ්ඩු කිරීම යි. මෙය කළ හැක්කේ නීතියේ ආධිපත්‍යය, නිදහස, සහ ආර්ථික, සමාජ ක්ෂේත්‍රවල අවම ලෙස මැදිහත් වීම සහතික කරන ආණ්ඩු ක්‍රමයකිනි. එය ''ලිබරල්'' ආණ්ඩු ක්‍රමය යි.

ClassWork.LK

# <u>ලිබරල් දේශපාලන මතවාදය</u>

## <u>ප්‍රධාන චින්තකයෝ හා ඔවුන්ගේ අදහස්</u>

### තෝමස් හොබ්ස් (1586-1679)

මොහු කිසිසේත් ම ලිබරල් චින්තකයෙක් නොවේ.

එහෙත් ලිබරල් දේශපාලන දර්ශනයේ මූලික ප්‍රවාද වන

I. තනි පුද්ගලයා රාජ්‍යයට පූර්වක ය,
II. පුද්ගලයා තාර්කික බුද්ධියක් හිමි ස්වායත්ත පුද්ගලයෙකි,
III. රාජ්‍යය යනු මනුෂ්‍යයන්ගේ සමාජීය නිර්මාණයකි

යන අදහස්වල ආරම්භකයා ඔහු ය.

1652 දී ලෙවියාතන් (*බැඩස්එය්බ*) නමැති දේශපාලන දර්ශනවාදයෙහි වැදගත් වන කෘතිය හොබ්ස් පළ කෙළේ අත්තනෝමතික රාජාණ්ඩු ක්‍රමය යුක්ති සහගත කිරීමට ය.

රාජ්‍යයේ සම්භවය පිළිබඳ ව ඔහු ගොඩ නැගූ සමාජ සම්මුතිවාදය තුළ, පසු කාලයේ ලිබරල්වාදී චින්තනයට මඟ පෑදූ ඉහත අප දැක්වූ අදහස් තුන ගැබ් වී තිබිණ.

ClassWork.LK

# ජෝන් ලොක් (1632-1704)

හොබ්ස්ට පසු ව එංගලන්තයේ බිහිවූ ප්‍රධාන දේශපාලන චින්තකයා වූ මොහු ලිබරල්වාදී දේශපාලන චින්තනයේ සැබෑ ආරම්භකයා ය.

දැඩි රාජාණ්ඩු විරෝධියකු වූ ලොක් එංගලන්තයේ රාජාණ්ඩුවාදීන් සහ පාර්ලිමේන්තුවාදීන් අතර තිබූ බල අරගලයේ දී පාර්ලිමේන්තුවාදීන්ගේ පිල නියෝජනය කෙළේ ය.

ලොක් 1690 දී ''ආණ්ඩුව ගැන රචනා දෙකක්'' යන ග්‍රන්ථය පළ කරමින් සම්භාව්‍ය ලිබරල් වාදයේ මූලික දේශපාලන ප්‍රස්තූතය ගොඩ නැඟී ය.

Class Work LK

ලිබරල්වාදී දේශපාලන මතවාදයට ලොක් සිදු කළ එකතුවේ ප්‍රධාන තේමා පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

I. රාජ්‍යයේ බලයේ මූලාශ්‍රය මහජනතාව යි.

II. ආණ්ඩු කිරීමේ බලය පාලකයන්ට ලැබී තිබෙන්නේ මහජනතාව විසින් ඔවුන්ට කොන්දේසි සහිත ව ලබා දී ඇති භාරකරත්ව බලයකි (Trusteeship).

III. මහජනතාව ලබා දී ඇති එම භාරකාරත්ව බලයේ කොන්දේසි නොකඩවා ඉටු කිරීමට පාලකයෝ බැඳී සිටිති. මහජනතාවගේ නිදහස, ජීවිතය හා දේපළවල ආරක්ෂාව සහතික කිරීම එම කොන්දේසිවල අරමුණ යි.

IV. තමන් සමඟ එකඟ වූ පාලකයෝ එම කොන්දේසි උල්ලංඝනය කරත් නම්, ඔවුන්ට දී ඇති බලය ආපසු කැඳවීමේ අයිතිය මහජනතාවට තිබේ.

ClassWork.LK

V. ආණ්ඩුවට ඇත්තේ සීමිත බලයකි. එම බලය සීමා වන මාධ්‍ය දෙකකි.

a. ආණ්ඩුවේ බලාධිකාරය, මහජනතාව පාලකයන්ට දී ඇති භාරකාරත්වය ගිවිසුමේ කොන්දේසිවලින් සීමා වී තිබීම.

b. පාලකයන්ට මහජනතාව ආණ්ඩු බලය පවරන්නේ සීමිත කාලපරිච්ඡේදයකට වීම.

ලොක් දේශපාලන චින්තනයට හඳුන්වා දුන් මෙම ප්‍රවාදය හඳුන්වන්නේ ''සීමිත ආණ්ඩුව'' (Limited Government) පිළිබඳ සංකල්පය ලෙස යි.

ClassWork.LK

## මොන්ටෙස්කියු (1689-1755)

ප්‍රංශ දේශපාලන චින්තකයකු වූ මොහු ලිබරල් දේශපාලන චින්තනයට කළ ප්‍රධානතම දායකත්වය වන්නේ බලතල වෙන් කිරීමේ සිද්ධාන්තය ගොඩ නැගීම යි.

ක්‍රි.ව. 1748 දී ප්‍රංශ භාෂාවෙන් පල කළ ''නීතියේ ජීවය'' නමැති කෘතියෙන් මේ සිද්ධාන්තය වර්ධනය කර තිබේ.

මෙහි ප්‍රධානතම මූලධර්මය වන්නේ ආණ්ඩු බලය ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ආණ්ඩුවේ ප්‍රධාන ශාඛා අතර බෙදී තිබිය යුතු ය යන්න යි.

Class Work LK

එසේ නොබෙදී එම බලතල එක් ආයතනයක් හෝ එක් පුද්ගලයකු හෝ වෙත කේන්ද්‍රගත වී තිබෙන කල එහි ප්‍රතිඵලය වන්නේ පුද්ගල නිදහස තරයේ ම උල්ලංඝනය කරන පාලන කේන්ද්‍රයක් බිහි වීම යි. මොන්ටෙස්ක්යු එය හඳුන්වන්නේ ''ප්‍රජාපීඩක පාලනය'' (Tyranny) ලෙස යි.

එය වැළැක්වීමේ මග වන්නේ ආණ්ඩුවේ එම බලතල ඒවා ක්‍රියාත්මක කරන ශාඛා අතර පැහැදිලි ව බෙදා ගැනීමත්, එම ආයතන එකිනෙකින් ස්වාධීන ව පැවැත්වීමත් ය.

දේශපාලන බලය පාලකයන් විසින් ප්‍රජා පීඩක ලෙස භාවිත කිරීමේ අනතුර නිරන්තරයෙන්ම තිබෙන නිසා මහජනයාගේ නිදහස ආරක්ෂා කිරීමට නම් එම බලයට සීමාවන් පැනවිය යුතු ය යන උපකල්පනය මත මෙම සිද්ධාන්තය ගොඩ නැගිණ. මේ සඳහා මොන්ටෙස්ක්යු යෝජනා කළේ ආණ්ඩු බලය එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ වෙත කේන්ද්‍රගත වීමට ඉඩ නොතැබිය යුතු බව ය.

Class Work.LK

## ෂෝන් ෂාක් රූසෝ (Jean Jacques Rousseau) (1712-1778)

ප්‍රංශ ජාතිකයකු වූ රූසෝ සමාජ ගිවිසුම්වාදී සම්ප්‍රදාය ය ඉදිරියට ගෙන ගිය අයෙකි.

1762 දී පළවූ ''සමාජ ගිවිසුම'' (Social Contract) ඔහුගේ ප්‍රධානතම දේශපාලන කෘතිය වේ.

ලොක්, මොන්ටෙස්ක්යු මෙන් ම රූසෝ ද උනන්දු වූයේ රාජ්‍යය විසින් කරනු ලබන උල්ලංඝනය කිරීම්වලින් මනුෂ්‍ය නිදහස, ආරක්ෂා කර ගැනීමට ය.

රාජ්‍යය මනුෂ්‍යයන්ගේ නිදහස සහ ආරක්ෂාව සහතික කිරීම පිණිස ඔවුන් ම නිර්මාණය කර ගැනණු ද, රාජ්‍යය විසින්ම මනුෂ්‍ය නිදහසටහානි කිරීමේ අනතුරද තිබේ. මෙම ප්‍රෙහේලිකාවට රූසෝ දුන් විසඳුමේ හරය වූයේ රාජ්‍ය බලය රාජ්‍යයන් තුළ සංවිධානය වී සිටින සෑම දෙනාගේ ම යහපත අරමුණු කරගත යුතු ය යන්න යි.

ClassWork.LK

රූසෝ සංකල්ප දෙකක් මාධ්‍ය කරගනිමින් මේ ප්‍රවාදය ඉදිරිපත් කළේ ය.

- ''පොදු කැමැත්ත'' (General Will) යන්න පළමු වැන්න වේ. රාජ්‍යය නියෝජනය කරන්නේ, පාලකයාගේ වත් සමාජයේ ටික දෙනෙකුගේ වත්, කැමැත්ත/යහපත නොව, රාජ්‍යයේ සාමාජිකයන් ව සටි න සෑම දෙනාගේම සාමූහික කැමැත්ත /යහපතය යන්න එහි අර්ථය වේ.

- ''මහජන පරමාධිපත්‍ය'' යන්න දෙවැන්න වේ. පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා වන්නේ රාජ්‍යය හෝ පාලකයන් හෝ නොව මහජනතාව ය, යන්න එහි අර්ථය වේ. මහජනයා සතු පරමාධිපත්‍යය අන්සතු කළ නොහැකි ය, බෙදිය නොහැකි ය.

ClassWork.LK

ClassWork.LK